වාර්ෂික කාර්ය සාධන වාර්තා හා ගිණුම් 2021

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

දුරකථන : 0112626211-3
ෆැක්ස් : 011-2695279
ඊ-මේල් : info@pubad.gov.lk
අන්තර්ජාල ලිපිනය : www.pubad.gov.lk

ගරු අමාත්‍යතුමාගේ සුභාශිංසනය



ඉසුරුමත් දේශයක් උදෙසා අතිගරු ජනාධිපති ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන් විසින් ඉදිරිපත් කරන ලද "රට හදන සෞභාග්‍යයේ දැක්ම" රජයේ ජාතික ප්‍රතිපත්තිය රටේ සමාජ, ආර්ථික හා සංස්කෘතික ආදී වූ සියළුම ක්ෂේත්‍රයන් ආවරණය වන අන්දමින් ක්‍රියාවට නැංවෙමින් පවතී. ජාතියේ අනන්‍යතාවත්, අවශ්‍යතාවත් මූර්තිමත් කෙරෙන ඉතාමත් ප්‍රායෝගික වූත්, සාධනීය වූත් උපාය මාර්ගික සැලැස්මක් එමඟින් එළි දක්වා ඇත. සමස්ත ජනතාවටම බලපාන සේ මේ රටේ ආරක්ෂාව, අභිවෘද්ධිය සහ සංවර්ධනය උදෙසා කැපවෙමින් සියළු දෙනාටම සම අවස්ථා සලසා දීමේ ක්‍රමෝපායක් ක්‍රියාත්මක කිරීම එම වැඩපිළිවලේ අපේක්ෂාවයි. "රට වෙනුවෙන් වැඩ කරන සංස්කෘතියක්" ස්ථාපිත කිරීම අරමුණු කරගත් එම නව දර්ශනය යතාර්ථයක් කර ගැනීමට නම් ඊට අනුරූපව මේ රටේ දේශපාලනඥයින්, නිලධාරීන් මෙන්ම ජනතාවද ආකල්පමය වශයෙන් මෙන්ම ක්‍රියාකාරීත්වයෙන්ද නව දිශානතියකට යොමු විය යුතුව තිබේ.නව මංපෙත් ඔස්සේ ගමන් කරමින් අපේක්ෂිත අන්දමින් රට නගාසිටුවීමට නම් අප සියලුදෙනාම අවුළුවාගත් බුද්ධියෙන් හා හැඟීමෙන් යුතුව ක්‍රියා කිරීම අනිවාර්යයෙන්ම සිදුවිය යුතුය.

මේ සන්දර්භය තුළ ජනතාවාදී රාජ්‍ය සේවාවක නව මානයන් සහ හැඩතල හඳුනාගනිමින් හා ඒ ඔස්සේ පියනඟමින් රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රය නව මංපෙතකට අවතීර්ණව ඇත. ඒ අනුව එවකට රාජ්‍ය සේවා අමාත්‍යාංශය ලෙස කොවිඩ් 19 වසංගත තත්වය තුළ සමස්ත ලෝකයේම ජන ජීවිතය අභියෝගයකට ලක්වූ වකවානුවේ දැඩි අනතුරුදායක තත්වයන් යටතේ වුවද රාජ්‍ය සේවා අමාත්‍යාංශයේත්, ඒ යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය, රාජ්‍ය භාෂා කොමිෂම, භාෂා අධ්‍යාපන හා පුහුණුව පිළිබඳ ජාතික ආයතනය, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව සහ රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය යන ආයතන සිය සේවා වගකීම් උපරිම මට්ටමෙන් ඉටුකිරීමෙහිලා දැක්වූ දායකත්වය කෘතවේදීව සිහිපත්කළ යුතුය.

උපාධිධාරීන් රටේ සංවර්ධනයට දායක කර ගැනීමේ අරමුණෙන් දියත් කරන ලද රැකියා විරහිත උපාධිධාරීන් රැකියාගත කිරීමේ ව්‍යාපෘතිය යටතේ 53,177ක උපාධිධාරීන් පිරිසකට රජයේ සේවයට ඇතුල්වීමට අවස්ථාව සලසාදීම, නවක නිලධාරීන් බඳවා ගැනීම තුළින් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ හා ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ කාර්යක්ෂමතා වර්ධනයට ඉඩ ප්‍රස්ථා සැලසීම, ඩිජිටල්කරණය මඟින් කාර්යාල කටයුතු පවත්වාගෙන යෑමේ ව්‍යාපෘතියක් හඳුන්වාදීම හා විදේශ ආධාර මත ග්‍රාමීය රෝහල් හා පාලම් ඉදිකිරීම වැනි නව ව්‍යාපෘති දියත් කිරීම තුළින් ග්‍රාමීය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට පියවර ගැනීම ඇතුළු ජයග්‍රහණ රාශියක්ම හිමිකර ගැනීමට සමත් ව ඇත.

ඒ අනුව ඉදිරියටත් රටේ අභිමානවත් ගමන් මඟට ශක්තියක්, ආලෝකයක් වෙමින් ජනතාවාදී රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීමේ සුවිශේෂී මෙහෙවරක නියැලීමට අත්වැල් බැඳගන්නා ලෙසට සියළු රාජ්‍ය නිලධාරීන්ටත්, විශ්‍රාමික නිලධාරීන්ට මෙන්ම පොදු මහජනතාවටත් සහෝදරාත්මකව ආරාධනය කරමි. එම කාර්යයෙහිලා කැපවී ක්‍රියා කරන මගේ අමාත්‍යාංශයේ ලේකම් ප්‍රමුඛ නිලධාරී මණ්ඩලයටත්, අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සෙසු ආයතනවල ප්‍රධානීන් ප්‍රමුඛ කාර්ය මණ්ඩලවලටත් ස්තුතිවන්ත වෙමි.

දිනේෂ් ගුණවර්ධන,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභානායක

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය



සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා රටේ සංවර්ධනයට උරදෙන "ජනතා කේන්ද්‍රීය රාජ්‍ය සේවයක්" ජාතික, පළාත් හා ප්‍රාදේශීය මට්ටමින් ඇති කිරීම උදෙසා ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වෙමින් දීප ව්‍යාප්ත හා ඒකාබද්ධ සේවාවන් ඇතුළු සමස්ථ රාජ්‍ය සේවය බල ගැන්වීම, මෙහෙයවීම හා මඟ පෙන්වීම මෙම අමාත්‍යාංශයේ කාර්යය හා කර්තව්‍යයන් අතර ප්‍රමුඛතාවය ගනු ලබන බව මාගේ හැඟීමයි. 'කෝවිඩ් 19' ගෝලීය වසංගතය හමුවේ 2021 වර්ෂය පුරා වරින් වර ක්‍රියාත්මක වූ රට අඟුළු දැමීම් හා සෞඛ්‍ය උපදෙස් යටතේ රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේම සේවක පිරිස් කැඳවීම සීමා කිරීමට සිදු වූ අතර නිෂ්පාදන ඵලදායීතාවය හා අපනයන ආර්ථිකය දුර්වල වීම මත රට ආර්ථික පසුබෑමකටද ලක් වූ බව නොරහසකි. 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශයේ අපේක්ෂිත ඉලක්ක ලභා කර ගන්නවාට වඩා කෝවිඩ් 19 වසංගතය පාලනය කර ගැනීම සඳහා එන්නත්කරණය හා සෞඛ්‍ය සුභ සාධනය සඳහා වැඩි අවධානයක් යොමු කිරීමට රජයට සිදු විය. එවැනි අභියෝගයන් හමුවේ වූවද 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශයේ ප්‍රමුඛතා මත අමාත්‍යාංශයේ මෙහෙවර පෙල ගස්වා කඩිනම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට 2021 වර්ෂයේදී මෙම අමාත්‍යාංශය සමත් වූ බව මෙහිදී සනිටුහන් කරනුයේ ඉමහත් සතුටිනි.

මහා භාණ්ඩාගාරය විසින් 2021 මුදල් වර්ෂය සඳහා මෙම අමාත්‍යාංශය වෙත වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන දැඩි මූල්‍ය විනයක් යටතේ කාර්යක්ෂමව හා ඵලදායී ලෙස යෙදවීමට හැකි වූ බව මාගේ විශ්වාසයයි. මෙම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර ගෙන යනු ලැබූ 'නිල පියස' නිල නිවාස ව්‍යාපෘති වල ඉතිරි වැඩ කොටස් කර ගෙන යාමත්, හෙක්ටර් කොඩ්ඩෑකඩුව මාවතේ රාජ්‍ය සේවක නිල නිවාස ව්‍යාපෘතිය හා මොණරාගල රාජ්‍ය සේවක නිල නිවාස ව්‍යාපෘතිය අවසන් කොට රාජ්‍ය සේවකයන් වෙත ලබා දීමත්, උපාධිධාරී අභ්‍යාසලාභීන් 53,000ට ස්ථිර පත්වීම් ලබා දී රාජ්‍ය ආයතන වෙත අනුයුක්ත කිරීමත්, දීප ව්‍යාප්ත සේවාවන් වල පවත්නා පුරප්පාඩු සඳහා අදාල බඳවා ගැනීම් පටිපාටිවලට අනුකූලව බඳවා ගෙන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය හරහා පුහුණුවීම් ලබා දී රාජ්‍ය ආයතන වෙත අනුයුක්ත කිරීමත්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ආර්ථික හා සමාජ සුබසාධනය වැඩි දියුණු කිරීමට කටයුතු කිරීමත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කටයුතු වලට අදාලව රජය විසින් ඉටු කල යුතු කාර්යයභාරයන් ඉටු කිරීමත්, රාජ්‍ය සේවක මඟ පෙන්වීම් වලට අදාල විවිධ චක්‍රලේඛ නිකුත් කිරීමත්, කරන ලද ප්‍රමුඛ කාර්යයන්ගෙන් කොටසක් ලෙස සඳහන් කල හැකිය.

මෙම අමාත්‍යාංශයේ කාර්භාරය සාර්ථකව ඉටු කිරීමට උපදෙස් හා මඟ පෙන්වීමක් කරන ලද ගරු රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමාටත්, අමාත්‍යාංශයේ කාර්යයභාරය සාර්ථකව හා කාර්යක්ෂමව ඉටු කිරීමට ඇප කැප වූ අතිරේක ලේකම්වරු, අධ්‍යක්ෂ ජනරාල්වරු, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරු, අධ්‍යක්ෂවරු, ප්‍රධාන මූල්‍ය නිලධාරී ඇතුළු සමස්ථ කාර්යය මණ්ඩලයටත් මෙම අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් ඇතුළු කාර්යය මණ්ඩලවලටත්, මාගේ ස්තුතිය පුද කරන අතර, ඉදිරි කටයුතු තවදුරටත් සාර්ථකව කර ගෙන යාමට ඔබ සැමට ශක්තිය හා ධෛර්යය ලැබේවායි මා ප්‍රාර්ථනා කරමි.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

පටුන

*	රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන ගරු.අමාත්‍යතුමාගේ පණිවිඩය	i
*	රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය	ii
01	**ආයතනික පැතිකඩ**	
1.1	හැදින්වීම	1
1.2	දැක්ම, මෙහෙවර, අරමුණු, උපායමාර්ග	2
1.3	ප්‍රධාන කාර්යයන්	4
1.4	සංවිධාන ව්‍යුහය	5
1.5	අමාත්‍යාංශය යටතේ ඇති ආයතන	6
02	**ප්‍රගතිය සහ ඉදිරි දැක්ම**	
2.1	2021 වසරේ වැදගත් සිදුවීම්	7
03	**වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්යසාධනය**	
3.1	මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය	24
3.2	අක්මුදල් ගැලපුම් ගිණුම	25
3.3	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	26
3.4	මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය	27
3.5	මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	28
3.6	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	29
3.7	ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	30
3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	31
3.9	විගණකාධිපති වාර්තාව	
04	**කාර්ය සාධන දර්ශක**	
4.1	ක්‍රියාකාරී සැලැස්ම මූලික කරගත් ආයතනික කාර්ය සාධන දර්ශක	32
	ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්ය සාධන දර්ශක (අංශ අනුව)	
	• ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවා අංශය	33
	• ශ්‍රී ලංකා පරිපාලන සේවා අංශය	39
	• ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා අංශය	42
	• ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා, තාක්ෂණික සේවා අංශය	50
	• ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවා අංශය	60
	• මූල්‍ය අංශය	63

- ඒකාබද්ධ සේවා අංශය
- අභ්‍යන්තර පාලන අංශය 102
- නිවාස අංශය 104
- ආයතන අංශය 105
- මානව සම්පත් සංවර්ධන අංශය 113
- සංවර්ධන අංශය 117
- විමර්ශන, පර්යේෂණ හා මෙහෙයුම් අංශය 120
- තොරතුරු තාක්ෂණ අංශය 125
- විශ්‍රාම වැටුප් අංශය 127
- අභ්‍යන්තර විගණන අංශය 130
- ජාතික භාෂා අංශය 132
- රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව 136
- ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය 148
- රාජ්‍ය භාෂා කොමිෂන් සභාව 151
- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව 154
- ශ්‍රී ලංකා ජාතික මානව සම්පත් සංවර්ධන සභාව 159
- දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය 162
- පාර්ලිමේන්තු කටයුතු අංශය 164
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය 166

06 මානව සම්පත් සැලැස්ම

6.1 අනුමත සේවක සංඛ්‍යාව 2021 167

6.3 කාර්ය මණ්ඩලයේ හැකියා සංවර්ධනය 172

07 අනුකූලතා වාර්තාව 178

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

හැඳින්වීම

වර්ෂ 2020ක් වූ අගෝස්තු මස 09 වන දින සිට රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වශයෙන් නම් කරනු ලදුව ආරම්භයේ පටන් වර්තමානය දක්වා සියළු රාජ්‍ය ආයතන හා රාජ්‍ය සේවකයන්ගේ අභිවෘද්ධිය උදෙසා සුපසන් සේවා සම්පාදනයක් උදෙසා ඉමහත් කැපවීමෙන් සහ වගවීමෙන් කටයුතු කරන මේ අමාත්‍යාංශයේ ඉතිහාසය වසර 84 ක තරම් දුරාතීතයකට විහිද පවතී. මුදල් අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තුවක් ලෙස වර්ෂ 1931 ට පෙර පැවති මෙම අමාත්‍යාංශය වර්ෂ 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ වලින් පසු තේරීපත් වන ආණ්ඩු යටතේ විවිධ වෙනස්කම් වලට ලක්වෙමින් පැමිණ අද වන විට රාජ්‍ය පරිපාලනයේ විශිෂ්ඨ මෙහෙවරක නියැලෙමින් සිටී.

වර්ෂ 2020ක් වූ අගෝස්තු මස 09 වන දින සිට රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය නමින් ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් අමාත්‍යතුමන්ගේ නායකත්වයෙන් ගොඩනැගෙන මේ අමාත්‍යාංශයෙහි රාජ්‍ය අමාත්‍යාංශය වන්නේ පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයයි.

'රාජ්‍ය සේවක මහගෙදර' වන මේ අමාත්‍යාංශය සියළු රාජ්‍ය සේවකයන් සඳහා අවශ්‍ය මහපෙන්වීම මෙන්ම රාජ්‍ය සේවය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් ගොඩනගමින් "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය මුදුන් පමුණුවා ගැනීමට මහත් කැපවීමෙන් කටයුතු කරන අතර ඒ සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය වෙත නායකත්වය ලබාදීමේ වගකීම අමාත්‍යාංශ ලේකම් ජේ.ජේ. රත්නසිරි මැතිදුන් විසින් නොපිරිහෙලා ඉටු කරනු ලබයි.

මහජනතාවට තෘප්තිමත් රාජ්‍ය සේවාවක් සහතික කිරීම සඳහා සාධාරණත්වය, සමරූපිතාවය හා කාර්යක්ෂමතාවය කෙරෙහි විශේෂයෙන් සැලකිලිමත් වෙමින්, පරිපාලන විධිවිධාන හා රෙගුලාසි සකස් කිරීම මේ අමාත්‍යාංශය සතු මූලික වගකීමකි. ඒ අනුව ආයතන සංග්‍රහය හා අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සකස් කිරීම, අවශ්‍ය සංශෝධන සිදු කිරීම මෙන්ම අවශ්‍ය අවස්ථාවලදී ඒ සම්බන්ධ නිරීක්ෂණ ලබා දීම ද අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබයි. රාජ්‍ය සේවා කටයුතු සම්බන්ධයෙන් ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදනය, අර්ථකථනය හා ඒ සම්බන්ධ මාර්ගෝපදේශ සැපයීම මේ අමාත්‍යාංශය වෙතින් ඉටුවන තවත් සුවිශේෂී කාර්යයකි. එමඟින් වඩා ඵලදායී සේවාවක් ලබා දීමට හැකිවන පරිදි සමස්ත රාජ්‍ය සේවයෙහි ම ක්‍රියාකාරීත්වය ගොඩනැගීම හා පාලනය සිදු කරනු ලබයි.

ජාතික සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා දීප ව්‍යාප්ත සේවාවන් හා සමස්ත ඒකාබද්ධ සේවාවන්හි පරිපාලන කටයුතු සිදු කරමින් රාජ්‍ය සේවය තුළ මානව සම්පත වඩාත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම ද මෙම අමාත්‍යාංශයේ මූලික කාර්යභාරයකි.

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 යටතේ සකස් කරන ලද රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ 2021 වාක කාර්යසාධන වාර්තාව හා ගිණුම් මෙමගින් ඉදිරිපත් කෙරේ.

රාජ්‍ය සේවා , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දැක්ම

දැයට විශිෂ්ඨ රාජ්‍ය සේවයක්

මෙහෙවර

මානව සම්පත නිසි පරිපාලනය, කළමනාකරණය හා
ප්‍රතිසංස්කරණය තුළින් විශිෂ්ඨ රාජ්‍ය සේවයක් තහවුරු කිරීම

විෂය පථය

සියළු රාජ්‍ය සේවාවන්හි පුර්ණ ධාරිතා සංවර්ධනයක් සිදු කරමින් නව තොරතුරු තාක්ෂණික ක්‍රමෝපායන් ඔස්සේ කාර්යයන් ද්විකරණය වළක්වාලමින් සේවා දායකයින් වෙත ප්‍රශස්ථ සේවාවන් ලබා දීම හා පළාත් හා ප්‍රාදේශීය මට්ටමින් පවතින අසමානතා අවම කරමින් ජනතාව වෙත උසස් සේවාවක් සහතික කිරීම

අරමුණු

- රාජ්‍ය සේවයේ මානව සම්පත් කළමනාකරණයේදී බඳවා ගැනීම්, පාරිශ්‍රමික සහ අනෙකුත් සේවා කොන්දේසි පිළිබඳ ඵලදායි රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
- මහජන අවශ්‍යතා සඳහා ප්‍රතිචාර දැක්වීමේදී දැනට රාජ්‍ය සේවයේ සිටින සේවකයින්ගේ සිතුම් පැතුම් අළුත් මගක් කරා මෙහෙයවීම.
- රාජ්‍ය සේවයේ ඵලදායිතාව සහ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා නව කළමනාකරණ ව්‍යුහපද්ධතියක් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- හර පද්ධතියක් ස්ථාපිතකොට බෙදාහදා ගැනීම (ප්‍රතිඵල දිශානත ආකල්ප, වගවීම, සම්පත් ප්‍රඥාවන්ත ලෙස යොදාගැනීම, අපක්ෂපාතිත්වය, පාරදෘශ්‍යබව, ආදී)
- පුහුණු වැඩසටහන්වලට පහසුකම් සැපයීම සහ ඒවා පැවත්වීම පිණිස රාජ්‍ය අංශයේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම.
- විශ්‍රාම වැටුප්වලට අදාළ ගැටළුවලට පිළියම් යෙදීම සඳහා විශ්‍රාම වැටුප් වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- රජයේ සංවර්ධන ඉලක්ක සහ ප්‍රමුඛතා සපුරාලීමේ හැකියාව සහිත රාජ්‍ය අංශයේ ආයතනික සංවර්ධනය සඳහා රාමුවක් සකස් කරගැනීම.

- සේවා සැපයුමේ ඵලදායිතාව සහ ගුණාත්මකබව ඉහළ නැංවීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යොදාගැනීම ප්‍රවර්ධනය කිරීම.
- රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩලයේ නිපුණතාව වැඩි දියුණු කිරීම.
- වෙනස්වෙමින් පවතින තත්ත්වයන්ට අනුව කටයුතු කිරීම පිණිස පද්ධති සරල කිරීම සහ ක්‍රියාදාම යළි සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ වැඩි දියුණු කිරීම, වර්ධනය කිරීම සහ ක්‍රියාවට නැංවීම.

<u>උපාය මාර්ග</u>

- රාජ්‍ය සේවයේ කාර්යක්ෂම මනාව සම්පත් කළමනාකරණය සඳහා විචක්ෂණ ප්‍රතිපත්තියක් සහ නියාමන රාමුවක්

- රාජ්‍ය සේවා සැපයුමේදී ඵලදායිතාව ඉහළ නැංවීම පිණිස ක්‍රියාදාම යළි සකස් කිරීම සහ පද්ධති සංවර්ධනය සඳහා වන පරිපාලන ප්‍රතිසංස්කරණය

- රාජ්‍ය සේවය සඳහා තරහකාරී බඳවාගැනීමේ හා තෝරාගැනීමේ ක්‍රියාදාමයන්

- ඉල්ලුම් දිශානත ධාරිතා සංවර්ධනය සහ නිපුණතා ගැලපුම

- සේවා සැපයුම පුරවැසියන්ට සමීප කිරීම සඳහා විමධ්‍යගත කරනු ලැබූ ආයතනික ජාල
- රාජ්‍ය සේවයේ ගුණාත්මකබව ඉහළ නැංවීම සහ සේවා සැපයුමේ පාරදෘශ්‍යභාවය සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම

- පුරවැසියා කේන්ද්‍ර කරගත් රාජ්‍ය සේවයක් වෙත නැඹුරු වූ සේවා සැපයුමක් ප්‍රමිතිගත කිරීම සඳහා පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් නිර්මාණය කිරීම



ප්‍රධාන කාර්යයන්

1. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "රට වෙනුවෙන් වැඩ සංස්කෘතියක්" ඇති කිරීම පිණිස අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මඟපෙන්වීම සිදු කිරීම සහ රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

2. ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය, ශ්‍රී ලංකා තාක්ෂණ සේවය හා ඒකාබද්ධ සේවාවන්හි ආයතනික, පරිපාලන හා පිරිස් කළමනාකරණය.

3. පාර්ලිමේන්තුව සම්බන්ධ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කටයුතු වලට අදාළව රජය විසින් ඉටුකළ යුතු කාර්යයන්.

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
සංවිධාන සැලැස්ම



අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතන

දෙපාර්තමේන්තු

1. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
2. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

ආයතන

1. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
2. දුරස්ථ අධ්‍යයන මධ්‍යස්ථානය
3. රාජ්‍ය භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය
4. රාජ්‍ය භාෂා කොමිසම
5. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

2021 වසරේ වැදගත්

සිදුවීම්

2021 වසරේ වැදගත් සිදුවීම්

වර්ෂ 2020ක් වූ අගෝස්තු මස 09 වන දින සිට රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය නමින් ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් අමාත්‍යතුමන්ගේ නායකත්වයෙන් ගොඩනැගෙන මේ අමාත්‍යාංශයෙහි, රාජ්‍ය අමාත්‍යාංශය වන්නේ පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයයි.

- බඳවාගැනීම්

දීප ව්‍යාප්ත සේවාවන්හි පැවති පුරප්පාඩු පිරවීම සඳහා 2021 වසරේදී නිලධාරීන් 610 දෙනෙක් රාජ්‍ය සේවයට බඳවාගන්නා ලදී.



ඒකාබද්ධ සේවාවන්හි පැවති පුරප්පාඩු පිරවීම සඳහා 2021 වසරේදී නිලධාරීන් 67071දෙනෙක් රාජ්‍ය සේවයට බඳවාගන්නා ලදී.



- **2021 දෙසැම්බර් 31 වන දිනට දීප ව්‍යාප්ත සේවයේ නිලධාරීන්.**

ශ්‍රී ලංකා පරිපාලන සේවය

ශ්‍රේණිය	අනුමත තනතුරු	තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්තය
විශේෂ	**395**	**354**	**41**	**-**
I	**981**	**646**	**335**	**-**
III/II	**1874**	**1590**	**284**	**-**
එකතුව	**3223**	**2590**	**660**	**-**

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය

ශ්‍රේණිය	අනුමත තනතුරු	තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්තය
විශේෂ	**80**	**0**	**80**	**-**
I	**489**	**635**	**-**	**146**
II/III	**1520**	**1049**	**471**	**-**
එකතුව	**2089**	**1684**	**551**	**146**

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය

ශ්‍රේණිය	අනුමත තනතුරු	තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්තය
විශේෂ	**55**	**48**	**7**	**-**
I	**275**	**275**	**-**	**-**
II	**47**	**247**	**-**	**200**
III	**1146**	**761**	**385**	**-**
එකතුව	**1523**	**1331**	**392**	**200**

ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය

ශ්‍රේණිය	අනුමත තනතුරු	තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්තය
විශේෂ	**76**	**59**	**17**	**-**
I	**190**	**116**	**74**	**-**
II/III	**803**	**669**	**134**	**-**
III(අධි සේවක)	**258**	**258**	**-**	
එකතුව	**1327**	**1102**	**225**	**-**

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය

ශ්‍රේණිය	අනුමත තනතුරු	තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්තය
විශේෂ	**01**	**01**	**-**	**-**
I	**06**	**04**	**02**	**-**
II/III	**69**	**38**	**31**	**-**
එකතුව	**76**	**43**	**33**	**-**

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය

ශ්‍රේණිය	අනුමත තනතුරු	තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්තය
විශේෂ	**18**	**12**	**06**	**-**
I	**52**	**29**	**23**	**-**
II/ III	**563**	**439**	**124**	**-**
II	**19**	**0**	**19**	
III	**8**	**2**	**6**	**-**
එකතුව	**660**	**482**	**178**	**-**

- **2021 දෙසැම්බර් 31 වන දිනට ඒකාබද්ධ සේවයේ නිලධාරීන්.**

සේවය	අනුමත	පවතින	පුරප්පාඩු
රාජ්‍ය කළමනාකරණ සේවය	**29785**	**24695**	**5090**
පරිවර්තක සේවය	**636**	**253**	**383**
පුස්තකාලයාධිපති සේවය	**625**	**124**	**502**
කාර්යාල සේවක සේවය	**-**	**16809**	**2092**
රියදුරු සේවය	**-**	**8490**	**-**
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය	**3022**	**1744**	**1578**
සංවර්ධන නිලධාරී සේවය	**64888**	**64888**	**-**
එකතුව	**98956**	**117003**	**9645**

- **2021 වසරේදී නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**
  - <u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ</u>

	චක්‍රලේඛ අංකය	නිකුත් කළ දිනය	කාරණය	යොමුව
01	01/2021	2021.02.24	ආයතන සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කරමින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ - 2020	-
02	02/2021	2021.03.05	රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වාගෙන යාම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2020 සහ ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති 2020.04.18 දිනැති අංක PS/GPA/චක්‍රලේඛ/ 20/2020 චක්‍රලේඛය, 2020.05.14 දිනැති අංක PS/GPA/චක්‍රලේඛ/ 21/2020 චක්‍රලේඛය සහ 2020.10.29 දිනැති අංක PS/GPA/චක්‍රලේඛ/ 33/2020 චක්‍රලේඛය
03	03/2021	2021.12.23	රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2020 අනුව පළාත් සංවර්ධන නිලධාරී සේවාවන් යටතේ පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ලද නිලධාරීන්ගේ ඉල්ලීම් අනුව ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරක් සඳහා ස්ථාන මාරු කිරීම	රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2020
04	04/2021	2021.03.19	භාෂා පරිවර්තක සංචිතයක් පිහිටුවීම	-
05	06/2021	2021.04.09	2021 රාමලාන් (රාමසාන්) සමයේ දී විශේෂ නිවාඩු ලබා දීම	-
06	07/2021	2021.04.09	කුසලතා පදනම මත කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන තරග විභාගය - 2019 (2020)	-
07	08/2021	2021.05.18	රජයේ කාර්යාල සඳහා විශේෂ නිවාඩු දින 02ක් ප්‍රකාශයට පත් කිරීම	-
08	09/2021	2021.05.21	උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා නිවාඩු ලබා දීම	-

09	10/2021	2021.06.07	රජයේ ගොඩනැඟිලි හා නිවාස කුලී “20.02.01.01” සඳහා ආදායම් ඇස්තමේන්තු - 2022	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015
10	11/2021	2021.06.07	රජයේ ගොඩනැඟිලි හා නිවාස කුලී “20.02.01.01” සඳහා හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම - 2021.06.30	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015
11	12/2021	2021.06.25	පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වල දී ජයග්‍රහණය කර එම ආයතනවල නගරාධිපති/ සභාපති, නියෝජ්‍ය නගරාධිපති/ උප සභාපති, නාගරික මන්ත්‍රීවරුන්/ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් ලෙස තේරී පත් වූ දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධරයන් වෙත ලබා දී ඇති රාජකාරි නිවාඩු සංශෝධනය	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2007 සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 32/91(III)
12	13/2021	2021.07.06	සේවාමුක්ත භටයෙකු පත් කිරීමේ දී අදාළ කර ගත යුතු වැටුප තීරණය කිරීම	ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ VII වැනි පරිච්ඡේදයේ 8 වගන්තිය
13	14/2021	2021.06.30	ජාතික ක්‍රීඩා දිනය ප්‍රකාශයට පත් කිරීම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2020
14	15/2021	2021.09.15	2020 පාර්ලිමේන්තු මැතිවරණයට	ආයතන සංග්‍රහයේ
			ඉදිරිපත් වූ දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන් වෙත වැටුප් ගෙවීම	XXXII වැනි පරිච්ඡේදයේ 2:3:2 උප වගන්තිය
15	16/2021	2021.09.13	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය	රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක 1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 202 රීතිය
16	17/2021	2021.09.13	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය (I, II හා III ශ්‍රේණි)	අමප/11/1090/523/087 හා 2011.05.11 දිනැති සහ අමප/14/0286/ 523/007 හා 2014.04.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ
17	18/2021	2021.09.13	ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - 2022	-
18	19/2021	2021.09.13	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2022	-
19	20/2021	2021.10.06	රාජ්‍ය ආදායම ඇස්තමේන්තු කිරීම,	මුදල් රෙගුලාසි 127(6)

			එකතු කිරීම, අධීක්ෂණය සහ වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ (රජයේ ගොඩනැඟිලි හා නිවාස කුලී - 20.02.01.01.)	සහ මුදල් රෙගුලාසි 128(2) ඉ
20	21/2021	2021.10.08	කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධිශ්‍රේණියේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් - 2022	රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදය
21	22/2021	2021.11.22	රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික සහ මාණ්ඩලික නොවන නිලධර ගණය වර්ගීකරණය	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 32/2017
22	23/2021	2021.11.05	රාජ්‍ය ආයතනවල නිලධරයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ දත්ත ‘ඉ-ග්‍රාම නිලධාරී’ පද්ධතියට ඇතුළත් කිරීම	-
23	24/2021	2021.12.02	රජයේ ගොඩනැඟිලි හා නිවාස කුලී “20.02.01.01” සඳහා හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම - 2021.12.31	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015
24	25/2021	2021.12.20	2022 වසර - රාජකාරී කටයුතු ඇරඹීම	-
25	26/2021	2021.12.24	රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් -2022 වසර	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2015

<u>සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ</u>

	චක්‍රලේඛ අංකය	නිකුත් කළ දිනය	කාරණය	යොමුව
26	12/2005(VIII)	2021.10.29	විශ්‍රාමික රාජ්‍ය නිලධරයන් සඳහා ක්‍රියාත්මක අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ වූ ප්‍රතිලාභ තවදුරටත් පුළුල් කිරීම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005(VI) සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005(VII)
27	12/2005(IX)	2021.11.09	විශ්‍රාමික රාජ්‍ය නිලධරයන් සඳහා ක්‍රියාත්මක අග්‍රහාර රක්ෂණ යොජනා ක්‍රමය යටතේ වූ ප්‍රතිලාභ තවදුරටත් පුළුල් කිරීම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005(VIII)
28	13/2008(VI)	2021.12.29	නිල වාහන සඳහා ඉන්ධන සැපයීම සහ එම වාහන රියදුරන් සඳහා අතිකාල හා සංයුක්ත	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2008(V)

			දීමනා ගෙවීම	
29	08/2010(I)	2021.12.29	රාජ්‍ය වියදම් කළමනාකරණය	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 08/2010
30	07/2017(I)	2021.02.05	මඳසරුභාවය සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට අවශ්‍ය රාජ්‍ය නිලධරයන්හට වැටුප් රහිත නිවාඩු ලබා දීම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2017
	චක්‍රලේඛ අංකය	නිකුත් කළ දිනය	කාරණය	යොමුව
31	26/2017(V)	2021.02.10	වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයන් සඳහා පැරණි අංක : 82/83 හා M/F කාණ්ඩ යටතේ ලියාපදිංචි පැරණි සාමාජිකයින්, මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ නැවත ලියාපදිංචි කිරීම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(I), රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(II), රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(III) සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(IV)
32	26/2017(VI)	2021.08.05	වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයන් සඳහා පැරණි අංක: 82/83 හා M/F කාණ්ඩ යටතේ ලියාපදිංචි පැරණි සාමාජිකයින්, මාර්ගගත ක්‍රමය ඔස්සේ නැවත ලියාපදිංචි කිරීම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(I), රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(II), රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(III), රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(IV) සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(V)
33	26/2017(VII)	2021.08.10	වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයන් සඳහා පැරණි අංක:82/83 හා M/F කාණ්ඩ යටතේ ලියාපදිංචි පැරණි සාමාජිකයින්, මාර්ගගත ක්‍රමය ඔස්සේ නැවත ලියා පදිංචි කිරීම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(I), රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(II), රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(III), රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ26/2017(IV), රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(V), සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(VI)
34	03/2019(II)	2021.02.16	ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පර්ච්ඡේදයේ 19:5 උප වගන්තිය යටතේ වූ විනය පරීක්ෂණ නිලධර නාම ලේඛනය	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2019 සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2019(I)

35	02/2021(I)	2021.04.27	රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වාගෙන යාම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021
36	02/2021(II)	2021.05.10	රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වාගෙන යාම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021 සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021(I)
37	02/2021(III)	2021.07.30	රාජ්‍ය සේවය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම	ජනාධිපති ලේකම්ගේ අංක PS/RD-A1/07/06/02 හා 2021.07.29 දිනැති ලිපිය
38	02/2021(IV)	2021.08.06	රාජ්‍ය සේවය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021(III)
39	02/2021(V)	2021.10.01	රාජ්‍ය සේවය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021(III) සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021(IV)
40	02/2021(VI)	2021.12.30	රාජ්‍ය සේවය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021(V)
41	07/2021(I)	2021.05.06	කුසලතා පදනම මත කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීමේ තරග විභාගය - 2019 (2020)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2021
42	07/2021(II)	2021.06.22	කුසලතා පදනම මත කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීමේ තරග විභාගය - 2019 (2020)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2021 සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2021(I)

<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි</u>

	චක්‍රලේඛ ලිපි අංකය	නිකුත් කළ දිනය	කාරණය	යොමුව
43	01/2021	2021.04.27	රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020
44	02/2021	2021.10.22	කෝවිඩ්-19 ආසාදිත රජයේ නිලධරයන් සඳහා අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ගෙවීම	-

තොරතුරු තාක්ෂණ අංශය

- **මාර්ගගත (Online) ක්‍රමවේදය මගින් පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ පහසුකම් සැපයීම.**

මීන් පෙර අමාත්‍යාංශ කාර්ය මණ්ඩල සඳහා තොරතුරු තාක්ෂණ අංශය තුළ පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ අනෙකුත් පුහුණු වැඩසටහන් සඳහා පහසුකම් සැපයීම සිදුකරන ලදි. පැවති කොවිඩ් 19 තත්වය සමග එම පහසුකම් සැපයීමේ අභියෝගය ජය ගැනීම සඳහා මාර්ගගත පුහුණු වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය මෘදුකාංග හා උපකරණ මිලදී ගැනීමට කටයුතු කරන ලදි. ඒ අනුව, මාර්ගගත (Online) තාක්ෂණය ඔස්සේ Zoom මෘදුකාංගය හරහා තොරතුරු තාක්ෂණ පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ අනෙකුත් පුහුණු වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සැපයීම සිදු කරන ලදී.

එසේම අමාත්‍යාංශයෙන් අභ්‍යන්තර නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට අමතරව පහත කාර්යන් සඳහා ද පහසුකම් සැපයීම සිදු කරන ලදී.

  - අමාත්‍යාංශයෙන් බාහිර ආයතනයන්හි සේවය කරන නිලධාරීන් සඳහා දැනුම සම්ප්‍රේශණය සඳහා මාර්ගගත පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා සහය ලබා දීම
  - අමාත්‍යාංශයේ විවිධ අංශයන්ට අදාල විවිධ වැඩසටහන් පුහුණු සැසි හා රැස්වීම් මාර්ගගතව පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම හා සම්බන්ධීකරණ කටයුතු

- **පරිගණක පද්ධති මෙහෙයුම් මැදිරිය නඩත්තු කිරීම**
- **අමාත්‍යාංශීය නිල වෙබ් අඩවියේ ආරක්ෂාව සහ අනෙකුත් ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම**
- **ගිණුම් අංශයේ අවශ්‍යතාවය මත නව පද්ධති නිර්මාණය කිරීම**
- **අමාත්‍යාංශීය තැපැල සඳහා නව මෘදුකාංග පද්ධතියක් නිර්මාණය කිරීම (1 අදියරය).**
- **මධ්‍යගතකරන ලද ඡායාපිටපත් යන්ත්‍ර ස්ථාපනය කිරීම..**
- **අමාත්‍යාංශයේ දෛනික රාජකාරි කටයුතු සඳහා සහය දැක්වීම සිදු කිරීම.**

විශ්‍රාම වැටුප් අංශය

<u>රාජ්‍ය නිලධාරීන්ගේ අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ වයස දීර්ඝ කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වීම.</u>





<u>පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.</u>

වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සම්පත් දායකත්වයෙන් සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූලව පුහුණු වැඩසටහනක් සංවිධානය කොට පවත්වන ලදී.





<u>ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා අංශය</u>

2021 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යය		සංඛ්‍යාව
<u>2021.12.31 වන දිනට ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් පිළිබඳ තොරතුරු</u>		
අනුමත සංඛ්‍යාව		1520
තත්‍ය සංඛ්‍යාව		1332
නව බඳවා ගැනීම් සංඛ්‍යාව	විවෘත පදනම මත	211
	සීමිත පදනම මත	31
<u>අනෙකුත් කාර්යන්</u>		
ස්ථීර කිරීම්		35
III සිට II ශ්‍රේණියට		102
II සිට I ශ්‍රේණියට		16
I සිට විශේෂ / අධි ශ්‍රේණියට		23
විශ්‍රාම යාම්		27
වාර්ෂික නොවන ස්ථානමාරු		54
<u>විනය කටයුතු</u>		
විනය කටයුතු ආරම්භ කරන ලද සංඛ්‍යාව		12
චෝදනා පත්‍ර නිකුත් කිරීම / නිදහසට කරුණු විමසීම		04
විනය නියෝග නිකුත් කිරීම		03
සේවය අතහැර යාමේ නිවේදනවලට එරෙහිව කරන ලද අභියාචනා		00

විවෘත බඳවා ගැනීම

ඉංජිනේරු විද්‍යාවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට විවෘත පදනම මත බඳවා ගැනීමට අදාළ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය 2021.04.03, 04 හා 05 වන දින පැවැත් වූ අතර, පැවති පුරප්පාඩු සංඛ්‍යාව අනුව නවක නිලධාරීන් 211 දෙනෙකු හට 2021.07.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට පත්වීම් ලබා දෙන ලදී.





සීමිත බඳවා ගැනීම

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරීන් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට සීමිත පදනම මත බඳවා ගැනීමට අදාළ විධිමත් සම්මුඛ පරීක්ෂණය 2021.02.26 දින පැවැත් වූ අතර, පැවති පුරප්පාඩු සංඛ්‍යාව අනුව මේ වන විට නිලධාරීන් 31 දෙනෙකු හට 2021.02.26 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට පත්වීම් ලබා දෙන ලදී.





විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම් ලත් නිලධාරීන්, එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ විධිමත් සම්මුඛ පරීක්ෂණය 2021.01.16 හා 17 දෙදින පැවැත් වූ අතර, පැවති පුරප්පාඩු සංඛ්‍යාව අනුව නිලධාරීන් 23 දෙනෙකු 2021.01.17 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කරන ලදී.

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ 2021.06.30 දිනට පැවති විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු 23ක් සඳහා 2021.09.17 දින අයදුම්පත් කැඳවා, 2021.11.06 දින සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදුව සියළුම සම්මුඛ පරීක්ෂණ

උපලේඛන, අදාළ නිරීක්ෂණ හා නිර්දේශ සමඟින් 2021.11.11 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.





සේවාරම්භක පුහුණු පාඨමාලාව

නවක නිලධාරීන් සඳහා වන සේවාරම්භක පුහුණුව කණ්ඩායම් 04ක් යටතේ පැවැත්වීමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් සංවිධාන කටයුතු සිදු කළ අතර කණ්ඩායම් 03ක් සඳහා සේවාරම්භක පුහුණුව ලබා දෙන ලදී.

දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සඳහා පාඨමාලා

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් හට දෙවන භාෂා ප්‍රවීණතාවය ලබා ගැනීමට අදාළව ජාතික භාෂා, අධ්‍යාපන හා පුහුණු ආයතනය සමඟ සම්බන්ධිත වෙමින් නිලධාරීන් 11 දෙනෙකු සඳහා 2021.11.16 දින සිට 2021.11.27 දින දක්වා දෙමළ භාෂා පුහුණු වැඩසටහන් පවත්වන ලදී.



විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

වෛද්‍ය නිලධාරීන්, දන්ත වෛද්‍ය නිලධාරීන් හා හෙද නිලධාරීන්ගේ අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව අවුරුදු 63 දක්වා දීර්ඝ කිරීම.
පවත්නා කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් වෛද්‍ය නිලධාරීන්ගේ හා හෙද නිලධාරීන්ගේ සේවය අත්‍යාවශ්‍ය වන බැවින්, රජයේ සේවයේ නියුතු සියලුම ශ්‍රේණීන්ට අයත් වෛද්‍ය නිලධාරීන්, දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් හා හෙද නිලධාරීන්ගේ අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව වයස අවුරුදු 63 දක්වා දීර්ඝ කිරීමට කටයුතු කර ඇත.

ත්‍රිවිධ හමුදා විශ්‍රාම වැටුප් හිමිගැන්වීමේ ක්‍රමවේදය පහසු කිරීම.

- විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක මගින් 10/2021 මගින් සේවා කාලය අවුරුදු 10/12 ට වැඩි සේවා විශ්‍රාම වැටුප හා දුබලතා විශ්‍රාම වැටුප යන දෙකටම හිමිකම් කියන සන්නද්ධ හමුදා සාමාජිකයින්ගේ අයදුම්පත්‍ර මාර්ගගත ක්‍රමය (PMS) ඔස්සේ යොමු කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීමට කටයුතු කර ඇත.

- දුබලතාවයට පත් සේවා විශ්‍රාම වැටුප්, වන්දි හා දීමනා ලබන නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් වයස අවුරුදු 55 දී ප්‍රතිශෝධන සේවා විශ්‍රාම වැටුප් අංකයෙන්ම ප්‍රතිශෝධන වැටුප ගෙවීම මෙම දෙපාර්තමේන්තුවෙන්ම සිදු කිරීම සඳහා විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 01/2021 මගින් අවශ්‍ය පහසුකම් සලසා දී ඇත.

- ත්‍රිවිධ හමුදා මරණ පාරිතෝෂික ගෙවීම් විධිමත් හා කඩිනම් කිරීම සඳහා 2021.11.15 දින සිට මරණ පාරිතෝෂික අයදුම්පත් මාර්ගගත ක්‍රමය ඔස්සේ යොමු කිරීමට විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 09/2015(IV) මගින් අවශ්‍ය පහසුකම් සලකා ඇත.

ඇඟිලි සලකුණු මගින් වාර්ෂික ජීවිත සහතික ලබා දීමේ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම.

- 2021.02.01 දින නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/2020 (සංශෝධන V) මගින් ඇඟිලි සලකුණු මගින් වාර්ෂික ජීවිත සහතිකය ලබාදීමේ පහසුකම් සැපයීමේ වැඩපිළිවෙලෙහි සිව්වන අදියර යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකු ශාඛා 20 ක් ඔස්සේ ද විශ්‍රාමිකයින් වෙත මෙම පහසුකම් ලබාදීමට කටයුතු කර ඇත.



මාතරදී පැවති සමාරම්භක උත්සවය

- 2021.11.10 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/2020 (සංශෝධන VI) මගින් මෙම පහසුකම මහජන බැංකු ශාඛා 125 ක් දක්වා තවදුරටත් පුළුල් කිරීමට කටයුතු කර ඇත.

පුද්ගලික පාසල් හා පිරිවෙන් ගුරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම විමධ්‍යගත කර කරණා සහගතව දෙන ලද පාරිතෝෂික දීමනාව රු.50,000 දක්වා වැඩි කිරීම.

යුද්ධයේදී මියගිය රණවිරුවන්ගේ පවුල් වලට විශේෂ ප්‍රතිලාභ.

වැන්දඹු අනත්දරු සාමාජිකත්වය යාවත්කාලීන කිරීම.

ත්‍රිවිධ හමුදා විශ්‍රාම වැටුප් හිමිගැන්වීමේ ක්‍රමවේදය පහසු කිරීම.

විශ්‍රාම වැටුප් අයදුම්පත් කළමනාකරණය පුර්ණ මාර්ගගත ක්‍රමයක් බවට පරිවර්තනය කිරීම.

කොවිඩ් තත්ත්වය යටතේ විශ්‍රාමිකයින් සුරක්ෂිත කිරීම.

රජයට ආදායම් උපයාදීම්

මෙම දෙපාර්තමේන්තුවට අයත් දැනට කුලී පදනම මත ලබා දී ඇති ගොඩනැගිලි සඳහා ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා ගොඩනැගිලි කුලිය ලෙස රු.25,891,740 ක මුදලක් සහ නිවාඩු නිකේතනයන් මගින් රු.169,555 ක මුදලක් රජයේ ආදායම් වශයෙන් උපයා දී ඇත.

ශ්‍රී ලංකා පරිපාලන සේවා අංශය

(i) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරින් අතුරින් නිලධාරින් 166 දෙනෙකු II ශ්‍රේණියට උසස්කිරීමේ කටයුතු සිදුකරන ලද අතර නිලධාරින් 50 දෙනෙකුගේ අයදුම්පත් නිර්දේශ කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.

(ii) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරින් 79ක් I ශ්‍රේණියට උසස්කිරීමේ කටයුතු සිදුකරන ලද අතර තවත් නිලධාරින් 04 දෙනෙකුගේ අයදුම්පත් නිර්දේශ කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.

(iii) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරින් අතුරින් නිලධාරින් 30 දෙනෙකු 2021.01.01 දිනට විශේෂ ශ්‍රේණියට උසස්කිරීමේ කටයුතු සිදුකරන ලද අතර මීට අමතරව තවත් 2021.07.01 දිනට විශේෂ ශ්‍රේණියට උසස්කිරීම සඳහා නිලධාරින් 19 දෙනෙකුගේ අයදුම්පත් නිර්දේශ කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.

(iv) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරින් 94 දෙනෙකු සේවයේ ස්ථිර කිරීම් සිදුකර ඇත.

(v) 2021 තුල ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරින් 35 දෙනෙකු විශ්‍රාමගැන්වීමට අනුමැතිය ලබා දී ඇත.

(vi) 2021 වසර තුල ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරින් 377 දෙනෙකුගේ ස්ථාන මාරු සිදුකර ඇත.

(vii) 2021 තුල ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරින් 23 දෙනෙකු පළාත් සභා වෙත මුදාහැරීම් කටයුතු සිදුකර ඇත.

(viii) 2021 තුල ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරින් 294 දෙනෙකු සඳහා වැඩබැලීම්/ රාජකාරි ඉටුකිරීම් කටයුතු සිදුකිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව පත්වීම් ලබා දී ඇත.

03. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවය කිරීම සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයට අයත් නිලධාරීන් තෝරාගැනීම සඳහා නිලධාරීන් 78 දෙනෙකු පළමු සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන ලදී.

04. ශ්‍රී ලංකා පරිපාලන සේවා නිලධාරීන්ගේ පහත සඳහන් පරිපාලන කටයුතු මාර්ග ගත ක්‍රමය ඔස්සේ ක්‍රියාත්මක කිරීමට නව තොරතුරු කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දීම.

(i) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයින්ගේ සේවය ස්ථිර කිරීමේ අයදුම්පත්‍රය යොමු කිරීම.

(ii) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියට උසස් කිරීමේ අයදුම්පත්‍ර යොමු කිරීම (2021.09.01 දිනට හෝ ඊට පසුව සුදුසුකම් ලබන නිලධරයින් පමණක් නව ක්‍රමවේදය භාවිතා කළ යුතු අතර අනෙකුත් නිලධරයින් දැනට පවතින ක්‍රමවේදය භාවිතා කළ යුතුය.)

(iii) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් තනතුරට විධිමත් පරිදි පත් කිරීමේ අයදුම්පත්‍ර යොමු කිරීම.

(iv) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ වැඩ බැලීම/රාජකාරි ඉටු කිරීම සඳහා වන අයදුම්පත්‍ර යොමු කිරීම.

(v) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයින්ගේ වාර්ෂික නොවන ස්ථාන මාරු අයදුම්පත්‍ර යොමු කිරීම.

පාර්ලිමේන්තු කටයුතු අංශය

➢අවශ්‍ය මානව සම්පත් සම්පාදනය

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී පෞද්ගලික කාර්ය මණ්ඩල පත් කිරීම.

අවශ්‍යතා පරිදි පෞද්ගලික කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීම.

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී පෞද්ගලික කාර්යමණ්ඩල සහ අනෙකුත් අදාළ රාජ්‍ය නිලධාරීන් සඳහා දැනුම්වත් කිරීම් හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

➢මූල්‍ය සම්පත් සම්පාදනය

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩල සඳහා වැටුප් ගෙවීම.

සේවය අවසන් කළ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී පෞද්ගලික කාර්යමණ්ඩල සඳහා පාරිතෝෂික දීමනා ගෙවීම.

➢භෞතික සම්පත් හා සේවා පහසුකම්සැ ලසීම.

කාර්යාල උපකරණ හා සන්නිවේදන උපකරණ සැපයීම.

තීරු බදු රහිත වාහන ආනයන බලපත්‍ර ලබා දීම.

ගරු මන්ත්‍රීවරුන් සඳහා සමූහ රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

➢ප්‍රතිපත්ති සම්පාදනය.

⊙අවශ්‍ය අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කොට ප්‍රතිපත්තිමය තීරණ ලබා ගැනීම.

⊙ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාවට නැංවීම.

⊙ අවශ්‍ය උපදෙස්/ මාර්ගෝපදේශ න්කුත් කිරීම.

ජාතික භාෂා අංශය

2020 අගෝස්තු 9 වැනි දින අංක 2187/27 දරන අතිරේක සාමාන්‍ය ගැසට් නිවේදනයට අනුව රාජ්‍ය භාෂා/ජාතික භාෂා විෂය රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට වෙන් කර ඇත. ප්‍රජාව තුළ සංහිඳියාව ඇති කිරීම සඳහා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය (OLP) ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ජාතික භාෂා අංශය අමාත්‍යාංශයේ එක් අංශයක් ලෙස ක්‍රියාත්මක වේ. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගෙන ඇති වැඩසටහන් විවිධ ස්ථරවලින් සහ විවිධ යාන්ත්‍රණයන් මඟින් රාජ්‍ය අංශය වෙත බෙදා හැරීම ජාතික භාෂා අංශය සිදු කරනු ලබයි.

ප්‍රාදේශීය මට්ටමින් ඇමතුම් මධ්‍යස්ථාන සහ භාෂා මධ්‍යස්ථාන 1956 අංකය මඟින් රාජ්‍ය නිලධාරීන් සහ මහජනතාව සඳහා භාෂා වැඩසටහන් ලබාදීම සඳහා අවශ්‍ය සේවා සහ පහසුකම් සපයයි. භාණ්ඩාගාරයේ සහය දක්වන වැඩසටහනට අමතරව, ජාතික භාෂා සමානාත්මතා දියුණු කිරීමේ ව්‍යාපෘතිය (NLEAP) සහ ශක්තිමත් කිරීමේ ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය (SRP) ලෙස හඳුන්වන ප්‍රධාන ව්‍යාපෘති මඟින් කැනේඩියානු රජය සහ EU සහාය දක්වයි.

ජාතික භාෂා අංශයේ අරමුණු

• රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම

• රාජ්‍ය අංශය තුළ ද්විභාෂාව ඇති කිරීමට සුදුසු පරිසරයක් ගොඩනැංවීම.

• රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාළව සාමාන්‍ය ජනතාව සවිබල ගැන්වීම.

ජාතික භාෂා අංශයේ කාර්යයන්

• රාජ්‍ය ආයතනවල ද්විභාෂා පරිසරය ශක්තිමත් කිරීම

• ද්විභාෂා සේවා සැපයීමේදී රාජ්‍ය නිලධාරීන්ගේ ධාරිතාව ඉහළ නැංවීම

• සාමාන්‍ය ජනතාව අතර රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ප්‍රවර්ධනය කිරීම

• රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ රාජ්‍ය ආයතන සඳහා පිළිගැනීම

ජයග්‍රහණ

ජාතික භාෂා අංශයට ර රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා මෙම වසර සඳහා රුපියල් මිලියන 21.35ක් වෙන් කර ඇති අතර එයින් රුපියල් මිලියන 7.34ක් වැය කර ඇත. සම්පූර්ණ ප්‍රතිපාදනවලින්, වැඩසටහන් වැය විෂය(2509) යටතේ ජාතික භාෂා සංවර්ධනය සඳහා රුපියල් මිලියන 20 ක් සහ වැය විෂය (1703) යටතේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති බද්ධ කිරීම සඳහා රුපියල් මිලියන 1.35 ක් වෙන් කර ඇත.

Covid 19 වසංගත තත්ත්වය හේතුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ යෝජනා කර ඇති සියලුම ක්‍රියාකාරකම් සිදු කිරීමට නොහැකි විය. එබැවින් මුදල් අමාත්‍යාංශයේ මාර්ගෝපදේශ මත පදනම්ව රුපියල් මිලියන 7.04 ක මුදල සඳහා ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් අනුව ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කරන ලදී.

මෙම කෙටුම්පත් වාර්තාවේ සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

.....

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

2021

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

එෆ්සී්-එල්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021		සටහන	කෘත්‍ය 2021	නැවත ගලපන ලද 2020	
රු.			රු.	රු.	
	ආදායම් ලැබීම්				
-	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	එෆ්සී්-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
1,200,000,000.00	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	1,288,512,491	1,152,983,938	
1,200,000,000.00	**මුළු ආදායම් ලැබීම් (අ)**		**1,288,512,491**	**1,152,983,938**	
	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර අග්‍රිම		1,789,170,000	663,062,717	එෆ්සී්-3
-	නැන්පතු		43,153,157	119,984,077	එෆ්සී්-4
-	අත්තිකාරම් ගිණුම්		53,491,275	126,409,395	එෆ්සී්-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**1,885,814,432**	**909,456,189**	
1,200,000,000.00	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**3,174,326,923**	**2,062,440,127**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)				
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**3,174,326,923**	**2,062,440,127**	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
15,586,674,000.00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	14,429,948,059	7,848,258,218	
264,206,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	203,401,934	217,874,461	
278,170,000.00	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	236,731,744	364,642,548	එෆ්සී්-2(ii)
-	පොළී ගෙවීම්	**8**		-	
450,000.00	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	429,370	386,714	
16,129,500,000.00	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**14,870,511,108**	**8,431,161,940**	
	මූලධන වියදම්				
49,010,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	33,695,645	20,101,395	
463,745,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	379,872,930	571,069,289	එෆ්සී්-2(ii)
151,145,000.00	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	70,513,258	67,728,425	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**		-	
411,100,000.00	හැකියා වර්ධනය	**14**	42,292,593	15,497,836	
104,500,000.00	වෙනත් මූලධන වියදම්	**15**	6,168,255	51,688,705	
1,179,500,000.00	**මුළු මූලධන වියදම් (උ)**		**532,542,681**	**726,085,650**	
	නැන්පතු ගෙවීම්		52,653,712	102,084,656	එෆ්සී්-4
	අත්තිකාරම් ගෙවීම්		55,490,301	61,120,746	එෆ්සී්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (එ)		**108,144,013**	**163,205,402**	
17,309,000,000.00	**මුළු වියදම් ඒ = (ඊ+උ+එ)**		**15,511,197,802**	**9,320,452,992**	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-ඒ)		**(12,336,870,879)**	(7,258,012,864)	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(12,336,870,879)	-	එෆ්සී්-7
			-	-	එෆ්සී්-3
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		**(12,336,870,879)**	**(7,258,012,864)**	

ඒසිඒ-7

අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

රු.

එකතු කලා:	වෙනත් ආයතන විසින්, **වාර්තාකරණ ආයතනය** වෙතුවෙන් එකතු කරන ලද ආදායම	1,274,440,152	
	අනෙකුත් **ශීර්ෂ** වෙතුවෙන් **වාර්තාකරණ ආයතනය** විසින් දරන ලද වියදම්	543,612	
	අනෙකුත් **ශීර්ෂ වෙතුවෙන් වාර්තාකරණ ආයතනය** විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙතුවෙන් කරන ලද හර කිරී	475,884	
	අනෙකුත් **ශීර්ෂ** විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම්	24,260,356	
			1,299,720,004
අඩු කළා :	අනෙකුත් **ආදායම් ශීර්ෂ** වෙතුවෙන්, **වාර්තාකරණ ආයතනය** විසින් එකතු කරන ලද ආදායම්	40,351,912	
	වෙනත් ආයතන විසින්, **වාර්තාකරණ ආයතනය** වෙතුවෙන් දරන ලද වියදම්	13,569,070,399	
	අනෙකුත් **ශීර්ෂ වෙතුවෙන් වාර්තාකරණ ආයතනය** විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙතුවෙන් කරන ලද බැර කිරී	24,895,791	
	අනෙකුත් **ශීර්ෂ** විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද හර කිරීම්	2,272,781	13,636,590,883
	2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම සැසඳුම් ප්‍රකාශය		**(12,336,870,879)**

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2021 රු.	2020 රු.
		තත්‍ය	
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	8,282,093,942	7,920,846,630
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	184,779,737	231,373,441
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**8,466,873,679**	**8,152,220,071**
ඉද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ඉද්ධ වත්කම්		(25,874,333)	(37,373,913)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		8,282,093,942	7,920,846,630
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	76,716,796	125,309,526
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	133,937,274	143,437,828
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**8,466,873,679**	**8,152,220,071**

පිටු අංක 1 සිට 45 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 46 සිට 65 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

නම : ජේ.ජේ.රත්නසිරි

තනතුර : ලේකම්

දිනය : 2022.02.25

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
වාරිමාර්ග, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරී

නම : ඒ.එච්.එම්.කේ.කේ.ඒ.හේරත්

දිනය : 2022.02.25

ඒ.එච්.එම්.කේ.කේ.ඒ. හේරත්
ප්‍රධාන මූල්‍ය නිලධාරී
වාරිමාර්ග, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

ඒසිඒ-සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූදල් ප්‍රවාහ ප්‍රකාශය

	තක්ෂ 2021 රු.	තක්ෂ නැවත ගලපන ලද 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	14,072,339	7,267,467
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	40,351,912	16,995,974
අග්‍රිම ලැබීම්	1,789,170,000	663,062,717
අත්තිකාරම් අයකර ගැනීම්	54,126,710	98,790,535
තැන්පතු ලැබීම්	43,153,157	11,510,409
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,940,874,118**	**797,627,101**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,347,172,942	411,758,827
සහනාධාර සහ මාරුකිරීම්	16,004,195	21,186,330
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	543,612	7,684,444
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම		
අත්තිකාරම් ගෙවීම්	53,693,404	110,585,744
තැන්පතු ගෙවීම්	52,653,711	6,719,745
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,470,067,864**	**557,935,090**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**470,806,254**	**239,692,011**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	470,806,254	239,692,011
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**470,806,254**	**239,692,011**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(470,806,254)**	**(239,692,011)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	**(0.00)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	**(0.00)**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	**(0.00)**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

